# ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
# ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
# SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION

| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | දිනය<br>திகதி<br>Date | 2022.07.08 |
|---|---|---|---|

## <u>මාධ්‍ය නිවේදනයයි</u>

2022.07.09 දින පැවැත්වීමට නියමිත සාමකාමී මහජන විරෝධතාව වැළැක්වීම සඳහා දුම්රිය හා බස් රථ ගමනාගමනය අත්හිටුවීම, ඉන්ධන බෙදාහැරීම තාවකාලිකව නවතා දැමීම හා එයින්ද නොනැවතී මහජනතාවගේ සාමකාමී රැස්වීමේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට බාධා පමුණුවමින් පොලිස් ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කිරීම තුළින් ගනු ලැබූ අනීතික උත්සාහයන් අප සංගමය දැඩිව හෙළා දකින්නෙමු.

පොලිස්පතිවරයා ගත් මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් මෙම මස 09 වන දින ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ මෙරටට ලැබීමට නියමිත යූරියා පොහොර මලුගත කිරීමේ ක්‍රියාවලියේ සිට ගොවීන් වෙත බෙදාහැරීම දක්වා වූ ක්‍රියාවලියට ඍජු බලපෑමක් ඇති කරන අතර මලුගත කිරීම හා ගොඩබෑම ප්‍රමාද වුවහොත් මහජන මුදලින් අධිභාර ගෙවීමට ද සිදුවනු ඇත.

මෙවැනි අනීතික තීරණ තුළින් මහජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට කටයුතු කරන ලද පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ගවලට එළඹීමට ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය කටයුතු කරනු ලබන බව ද අවධාරණය කරමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

| | |
|---|---|
| පදුල ශ්‍රී රෝහණ ද සිල්වා<br>ගරු සභාපති | ප්‍රදීප් ලක්ශාන්ත<br>ගරු ලේකම් |

**23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05.** 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
**23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.**

දුරකතනය/ தொலைபேசி/**Telephone : 011 5766855** ෆැක්ස්/தொலைநகல்/ **Fax : 011 2058027**
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ **Email : sasa.execo@gmail.com** වෙබ් අඩවිය/இணையத்தளம்/ **Web: www.sasa.lk**